(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 401.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 ඔක්තෝබර් මස 25 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2695/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මහපැලැස්ස ගම්මානය ආශ්‍රිතව ලොව ප්‍රචලිත මදුනාගල උණුදිය උල්පත් පිහිටා ඇති බවත්;

(ii) එම උණුදිය උල්පත් ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කළ බවත්;

(iii) මේ වන විට එම ප්‍රදේශයට දෙස් විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්;

(iv) උණුදිය උල්පත් ආශ්‍රිත ප්‍රදේශයේ සංවර්ධනයට ලක්වූ, සංචාරකයින් සඳහා වූ පහසුකම් මේ වන විට ගරා වැටෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මදුනාගල උණුදිය උල්පත් ආශ්‍රිත සංචාරක කලාපයේ පවතින අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමට ඉලක්කගත වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළ දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3310/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 දෙසැම්බර් 31 වැනි දිනට සහ අද වන විට විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට අද දක්වා, විදේශ රැකියා මගින් රට තුළට ගලා ආ මුළු විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඇමරිකා එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සේවා ගිවිසුම් කඩකිරීම හේතුවෙන් සෑම වර්ෂයකම පිටුවහල් කෙරෙන හෝ ආපසු එවන විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

(iv) විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන්ගෙන් රක්ෂණ යෝජනා ක්‍රමය හරහා උපයා ගන්නා මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ඉහත සඳහන් රක්ෂණ අරමුදල්වලින් එතෙර සේවය කරන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4086/'13

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කර ඇති නියෝජ්‍ය තැපැල්පති කේ. ඒ. එස්. සේනාධීර මහතාට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ I වැනි උපලේඛනය යටතේ චෝදනා පත්‍ර දෙකක් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) ඉන් එක් චෝදනා පත්‍රයක සඳහන් වූ චෝදනාවකට වැරදිකරු වූ බැවින් ඔහුට දඬුවම් ලබා දී ඇති බවත්;

(iii) අනෙක් චෝදනා පත්‍රය සම්බන්ධයෙන් මේ දක්වා විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොමැති බවත්;

(iv) මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීමට නියෝජ්‍ය තැපැල්පති සේනාධීර මහතාට සුදුසුකම් නොමැති බවට විගණකාධිපතිවරයා විසින් දන්වා ඇති බවත්;

(v) සේනාධීර මහතා ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස අයථා ලෙස ලබාගෙන ඇති මුදල් ආපසු අය කර ගන්නා ලෙස විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සේනාධීර මහතා සම්බන්ධයෙන් ඉතිරිව ඇති අනෙක් චෝදනා පත්‍රය පිළිබඳව විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන්නේද;

(ii) ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් ඔහු අයථා අන්දමින් ලබාගෙන ඇති මුදල් අය කර ගැනීම සඳහා විනයානුකූලව කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4281/'13

4.

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ ජූනි මාසයේ සිට රජයේ රෝහල් සඳහා දියවැඩියා රෝගීන්ගේ රුධිරයේ 'ග්ලූකෝස්' මට්ටම පරීක්ෂා කිරීමට යොදා ගන්නා පටි (Blood Glucose Test Strips) මිලදී ගනු ලැබූ සමාගම කවරේද;

(ii) එම සමාගමෙන් මිලදී ගනු ලැබූ එම උපාංග ප්‍රමාණය කොපමණද;

(iii) එම "Glucose Test Strip" එකක ගැණුම් මිල කොපමණද;

(iv) රජයේ රෝහල්වල 2013 අගෝස්තු මාසයේ සිට මෙම Glucose Test Strips වල හිඟයක් හෝ සම්පූර්ණයෙන්ම නොමැති බවක් වාර්තා වී තිබේද;

(v) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4571/'13

5.

ගරු අනුර දිසානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2011 සිට මේ දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් එක් එක් වරාය වෙත පැමිණි නැව් සංඛ්‍යාව හා හුවමාරු වූ බහාළුම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ ඉහත එක් එක් වරායේ මෙහෙයුම් ලාභය හෝ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමස්තයක් වශයෙන් ඉහත කාල සීමාව තුළ ලැබූ ආදායම හා ලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4671/'13

6.

ගරු පී. හැරිසන් මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සමුළුව පවත්වනු ලැබූ ප්‍රදේශය සහ හෝටලය කවරේද;

(ii) එම සමුළුවට සහභාගී වූ ව්‍යාපාරිකයින් නියෝජනය කරන ලද රටවල් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී සමුළුව සඳහා ශ්‍රී ලංකා රජය වැය කළ මුදල සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමුළුවෙන් පසුව ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් බදු සහන ලබා දී තිබේද;

(ii) එමගින් ශ්‍රී ලංකා රජයට හා ජනතාවට ලැබෙන වාසි වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සමුළුවට පැමිණි ව්‍යාපාරිකයන් විසින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට වැඩි කැමැත්තක් දැක්වූ විශේෂ ව්‍යාපෘති තිබේද;

(ii) එසේ නම්, ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4768/'14

7.

ගරු අශෝක් අබේසිංහ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකාවේ ඇති උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) රජය මගින් කුලී ගෙවමින් පවත්වා ගෙන යනු ලබන උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) උප තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ පෞද්ගලික මුදලින් කාර්යාල ගොඩනැගිලි සඳහා වන කුලිය ගෙවීම නවතාලීමට පියවර ගන්නේද;

(iv) රු. 250/- ක වන ගොඩනැගිලි කුලී දීමනාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4856/'14

8.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන නිවාස වැඩසටහන් කවරේද;

(ii) මේ වන විට එම වැඩසටහන් යටතේ ගොඩ නගා, ජනතාවට ලබා දී ඇති නිවාස ව්‍යාපෘති කවරේද;

(iii) එම නිවාස ව්‍යාපෘති යටතේ නිවාසලාභීන් තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියා පිළිවෙත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති යටතේ නිවාස ලබා දුන් අයගේ නාම ලේඛනයක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මෑතක දී ජනතාවට පවරා දී ඇති මාළිගාවත්ත නිවාස සංකීර්ණය එහි මුල් පදිංචිකරුවන්ට ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) 2014 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ නිවාස වැඩසටහන්වල ඉලක්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4871/'14

9.

ගරු තිස්ස අත්තනායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) නොරොච්චෝල තාප බලාගාරයේ බිඳ වැටීම් සහ නඩත්තු කටයුතු හේතුවෙන් නිෂ්පාදන කටයුතු නවතා දැමීම නිසා ජාතික විදුලිබල පද්ධතියට මේ දක්වා අහිමි වූ විදුලි ධාරිතාවය කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 පෙබරවාරි 13 වැනි දින නොරොච්චෝල තාප බලාගාරයේ කන්ඩෙන්සර් පද්ධතියට ලුණු හෝ ඒ හා සමාන කිසියම් රසායනික ද්‍රව්‍යයක් එකතු කර ඇති බවට ඉදිරිපත් වූ ප්‍රකාශයෙහි සත්‍යතාවයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව මේ වන විට සිදු කර ඇති පරීක්ෂණ කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වරදකරුවන් වූ පුද්ගලයෝ කවුරුන්ද;

(iv) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5035/'14

10.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුදු පොල්තෙල් (Virgin Coconut Oil) සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉහළ ඉල්ලුමක් පවතින බවත්;

(ii) අධික මිල ගණන් යටතේ අලෙවි වන සුදු පොල්තෙල් අපනයනය කිරීමෙන් විශාල වශයෙන් විදේශ විනිමය උපයා ගැනීමේ අවස්ථාවක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙරට ඇති සුදු පොල්තෙල් නිපදවනු ලබන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) වාර්ෂිකව නිපදවනු ලබන සුදු පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(iii) 2013 වර්ෂයේදී සුදු පොල්තෙල් අපනයනයෙන් ලැබූ ආදායම කොපමණද;

(iv) එම කර්මාන්තකරුවන් සඳහා රජය මගින් ලබාදී ඇති අනුග්‍රහයන් කවරේද;

(v) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සුදු පොල්තෙල්වල තත්ත්වය උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා සම්මත තත්ත්ව පාලන ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5174/'14

11.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුවට, මහජන බැංකුවට සහ වෙනත් බැංකුවලට ගෙවිය යුතුව ඇති ණය සහ පොලී ප්‍රමාණය කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5180/'14

12.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය මැතිවරණ කොට්ඨාසයේ, වැලිපැන්නගහමුල්ල තැපැල් කාර්යාලය ඉදිකිරීම සඳහා අවසන් වරට මුල්ගල තබන ලද දිනය කවරේද;

(ii) එකී තැපැල් කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් මුල්ගල් තබන ලද වාර ගණන කොපමණද;

(iii) එම එක් එක් අවස්ථාවේදී පවත්වනු ලැබූ උත්සව සඳහා සිදුකළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට අපහසුතා මධ්‍යයේ පවත්වාගෙන යන ඉහත තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු යොදා තිබේද;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීමට ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(iii) ඒ අනුව එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම, වැඩ අවසන් කිරීම සහ ජනතා අයිතියට පැවරීම සඳහා නියමිත දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5202/'14

13.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවයේ නියුතු මුස්ලිම් ආගමික බැතිමතුන් උම්රා සහ හජ් ආගමික වන්දනාව සඳහා විදේශගත වීම සඳහා අවසර ලබා ගැනීමට ඉදිරිපත් කරන අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ලේඛන කවරේද;

(ii) අදාළ පුද්ගලයා ගුරුවරයකු වන විට, ඔහුට එම වන්දනා ගමන සඳහා වැටුප් සහිත නිවාඩු හිමි වන්නේද;

(iii) උම්රා වන්දනාව සහ හජ් වන්දනාව සඳහා විදේශගත වන අය සඳහා සරල අයදුම්පත් හා වීසා ලබාදීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා මැදිහත්වීමක් සිදු කරන්නේද;

(v) ඉහත වන්දනා චාරිකාවේ යෙදෙන රජයේ සේවකයින් සඳහා අනුමත කරන නිවාඩු දින ගණන කොපමණද;

(vi) එම දින ගණන ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2731/'12

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාන්පිටි මිල ඉහළ යාමත් සමග විවිධ ප්‍රදේශවල විවිධ මිල ගණන් යටතේ පාන් අලෙවි කරන බවත්;

(ii) පාන් ගෙඩියක තිබිය යුතු නියමිත බර ග්‍රෑම් 450 ක් වුවත්, මේ වන විට වෙළඳපොළෙහි අලෙවි කරනු ලබන පාන්වල එම නියමිත බර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාන් ගෙඩියක තිබිය යුතු නියමිත බර හා පාන් ගෙඩියක් සඳහා වන නියමිත මිල පිළිබඳව අදාළ නිලධාරීන් විසින් බේකරි හිමියන් හා පාන් අලෙවි කරන්නන් දැනුවත් කර තිබේද;

(ii) නියමිත බර නොමැති හා නියමිත මිලට වඩා වැඩි මිලකට පාන් අලෙවි කරන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීමට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

ගරු රවී කරුණානායක මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 සැප්තැම්බර් මාසයේ සිට මේ දක්වා,

(i) උතුරු - නැගෙනහිර යුද්ධයෙන් පසුව, පුද්ගලයින් රඳවා තබන සරණාගත කඳවුරු තිබේ නම්, ඒවා පිහිටි ස්ථාන කවරේද;

(ii) එලෙස රඳවා තබාගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 සැප්තැම්බර් මාසයේ සිට මේ දක්වා,

(i) එල්.ටී.ටී.ඊ. සැකකරුවන් ලෙස අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් කඳවුර තුළ රඳවා තබාගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ට ලබාදෙන පුහුණු කවරාකාරද;

(iv) ඔවුන්ගේ අනාගත සුභසිද්ධිය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම**

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන (සංශෝධන),— 2013 අංක 36 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) — (පළමුවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2014 ඔක්තෝබර් 24) [1]

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*3.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*15.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*16.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*17.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*18.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

26.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

27.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---